*(All Rights Reserved)*


01. පහත දී ඇති ඡේද ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ) මෙසේ අශෝකමාලා දේවීන් ගෙන නුවරට ගිය කල්හි 'ශාලිරාජකුමාරයෝ තමන්ට පාදපරිචාරිකා කොට සැඬොල්දුවක ගෙනාහ' යි සියලු නුවර එක පැහැර ක්ෂෝභ ව ගියහ. දුටුගැමුණු රජ්ජුරුවෝ එපවත් අසා නො සතුටු ව තමන්ගේ වල්ලභ වූ ස්ත්‍රියක කැඳවා, 'කෙල, තෝ මපුතණුවන් කරා ගොස් "ස්වාමීනි, නුඹ පියාණන් වහන්සේ නුඹ සිතට ප්‍රිය වූ රාජකුමාරිකාවක හෝ බ්‍රාහ්මණ කුමාරිකාවක හෝ ගෙනවුත් පාදපරිචාරිකා කොට පාවා දී නුඹ ඔටුනු පළඳවා රාජ්‍යය දෙනු කැමති සේක; එසේ හෙයින් තෙල චණ්ඩාල කෙල්ල හැරපුව මැනවැ යි, රාජවංශයට කිලුටු නො කළ මැනවැ" යි කාරණා කියා මපුතණුවන්ගේ අභිප්‍රාය දැන මට වහා අවුත් කියව' යි උගන්වා යවූහ. ඕ ද එපරිද්දෙන් ම රාජකුමාරයන්ට කිව.

i. වල්ලභ ස්ත්‍රිය අනතුරු ව සිදු කළේ කුමක් ද?
ii. ශාලිරාජකුමාරයෝ පියරජුගේ අදහසට දැක් වූ ප්‍රතිචාර කෙසේ වී ද?
iii. 'පියාණන් වහන්සේ' යන්නෙහි ව්‍යාකරණ විභාග කරන්න.
iv. **පාදපරිචාරිකා, ක්ෂෝභව, වල්ලභ** යන පදවල අර්ථ ලියන්න.

(ආ) සීනෙන් සැඟවෙන්නට බැරියා සේ මුයිත් අවුදින් මෙතැනට සම්භ වූ ය. ආදි ම කවුළුදොරත් මෙසේ වූ අවුල් තකා වසාලන්ට නුවූ හෙයින් මුන් අවුත් සිටිය දී වසාලන්ටත් තරම් නො වෙයි. කළමනා කිමෙක් දෝ හෝ' යි සිතත් කබලු කන්ට සිතාගත් උපදේශ මුත් පරලොවින් ගැලවෙන උපදෙස් පමණකුත් තමන් නො දත් හෙයින් එසේ වූ තැනට සිතන්ට නිස්සක් සිතාගත නො හී ගින්නකට දමාලූ ලුණු මෙන් තතනමින් 'මහණ, මේ අහස සිටිනා තබා සක්මන් කෙළෙහි නමුත් මින් ලබන දෙයෙක් නැතැ' යි කී ය.

i. මෙහි 'මුයිත්' යනු කවුරුන් ද?
ii. සිටුවරයා තතනමින් කුමක් පැවසුවේ ද?
iii. මෙහි එන උපමා උපමේය උපුටා දක්වන්න.
iv. **පරලොවින් ගැලවෙන උපදෙස් පමණකුත්** යනු කුමක් ද?

(ඇ) මෙසේ බමුණු කී බස් අසා මඬුවා කියනුයේ 'මේ බමුණු ඉතා ම පක්ෂග්‍රාහී එකෙක. සියලු රාජ්‍යය අළලා බොහෝ වධ- බන්ධනාදියෙන් සත්ත්වයන් පෙළන, ඡන්දයෙන් අගතියට ගොස් ප්‍රජා පාලනය නො කොට හිඳිනා මේ රජ හට මා කීයේ වැරැද්ද ය යි කියයි. ඉදින් බමුණ, මේ රජ දශරාජ ධර්මයෙන් රාජ්‍යය කරන්නේ වී නම් මේ රාජ්‍යය වස්ත්‍රාභරණ ධනධාන්‍යයෙන් සමෘද්ධ වන්නේ ය; කලට වැසිත් වැස සමෘද්ධ ව ශස්‍යයෙන් යුක්ත වන්නේ ය. සියලු වැව් පොකුණු හෝ කඳුරැළි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය. සත්ත්වයෝත් සුඛිත මුදිත වූවාහු බත් අනුභව කරන කල්හි අග්‍රපිණ්ඩය ඇර කපුටුවන්ට දෙන්නාහ. කපුටුවෝ බත් අනුභව කොට මෙලෙස ප්‍රාණවධ නො කරන්නාහ යි යනාදීන් රජ්ජුරුවන්ගේ අමැදහත්කමින් මේ සියල්ල වන්නේ ය' යි වෘක්ෂ දේවතාවාගේ ආනුභාවයෙන් කීහ.

i. මෙහි රජු කෙබඳු පුද්ගලයෙක් ද?
ii. අග්‍රපිණ්ඩය ලද කපුටෝ කුමක් කරත් ද?
iii. දශරාජ ධර්මයෙන් පාලිත රාජ්‍ය කෙබඳු වේ ද?
iv. **රාජ්‍ය අළලා, අගතියට හෝ අමැදහත්කමින්** යන පදවල අර්ථ දක්වන්න.

02. පහත දී ඇති පද්‍ය ඇසුරින් අසා ඇති සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ප්‍රශ්නවලට වර්තමාන ලිඛිත බසින් ම පිළිතුරු සැපයිය යුතු යි.

(අ)
පඬි නිරිඳු නැණසක්
පැ මුළු දෙරණ අණ සක්
දිනුව යි විරිදු සක්
අයෙක් පවසති ඔහුගෙ වෙසෙසක්

සොළී පඬි ලාට රට
ගුජර තුළුවර මහ රට
තෙලිගු වඟු රට සිට
පැමිණි දන තමතමන්ගේ රට

ජයගෙන රුපු රදුන්
තුටු කර සියල් දිළිඳුන්
විඳ සව්සිරි නඳුන්
වනත රජ කරන රඟ නිරිඳුන්

i. පඬි නිරිඳුගේ විශේෂත්වය කුමක් ද?
ii. කුමන දේශවලින් ජනයා පැමිණ සිටිත් ද?
iii. ඒ ඒ රජවරු රාජ්‍ය කරන අයුරු කෙසේ වෙත් ද?
iv. **නැණසක්, ගුජර, වනත** යන පදවල අර්ථ දක්වන්න.

(ආ) එන රිවි බිඹු දුලා ගිරග බලා යා
ගිරි නිල් මල් තුලා පිල් සසලා යා
දිගු කර නිල් ගෙලා දිගු හඬලා යා
රඟන මොනර බලා නො සිට පලා යා

දුනුකේ පෙති ගොතා වරල ඉතායා
පිපිමල් රොන් ගතා තවර ගතායා
වියොවග යුද පතා එ වන පෙතායා
දක වනසර කතා නො කර කතායා

i. පායා එන බබළන සූර්ය බිම්බය දකින්නෝ කවරහු ද?
ii. වනසර කතාවන් කෙබඳු වී ද?
iii. **වියොවග යුද පතා** යන්නෙහි කාව්‍යෝක්ති ලක්ෂණ පැහැදිලි කරන්න.
iv. **ගිරග, වියොවග** යන පද විසන්ධි කර දක්වන්න.

03. පහත සඳහන් උද්ධෘත පදවල **අවස්ථා සම්බන්ධය** ලියන්න.

i. 'කසී රජ්ජුරුවන්ගේ සුභද්‍රා නම් අගමෙහෙසුන් බිසවක් ඇත.'
ii. 'වැඩිමහලු තැනැත්තන් තබා බාල තැනැත්තන් ගෙන්වන හෙයින් තොප ජේට්ඨාපචායන කර්මය නො කරන හෙයි නැ'
iii. 'රාජ්‍යවාසීනුත් මේ දුක්ඛයෙන් මුදා මොහුත් පරලොව භයින් ගලවා දැහැමින් රාජ්‍ය රකිනා ලෙස අවවාද දෙමි.'
iv. 'මෙතැන් පටන් තොප අභිප්‍රාය වූ පරිද්දෙන් මේ රාජ්‍යය විචාරව'

04. මෙම ප්‍රශ්නයෙහි සියලු ම අනුකොටස්වල **නිවැරදි වරණය** තෝරන්න.

1. **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය** තෝරන්න.
   i. කම්කරුවෝ කම්කරු දින රැලියට පැමිණ නැත.
   ii. මම සමඟ අම්මා වෙද ගෙදරට ගියා ය.
   iii. ඔහු ද මම ද සම්මන්ත්‍රණයට සහභාගි වීමි.
   iv. නුඹත්, ඇයත්, මමත් එක සේ විභාගයට වෙහෙසෙන්නෙමු.
   v. නුඹ හෝ ඇය විවාදයට සහභාගි වන්නෙහි.

2. **අර්ධ ස්වර පමණක් සහිත** වරණය තෝරන්න.
   i. ග, ජ, ඩ, ද, බ
   ii. එ, ඔ, ඖ
   iii. ය, ර, ල, ව
   iv. ඤ, ණ, න, ම
   v. අ, ඇ, ඉ

3. පද සියල්ලෙහි **අක්ෂර වින්‍යාසය** නිවැරදි වරණය තෝරන්න.
   i. සෙවිලි, බැලළි, සුළඟ, දෝලාව
   ii. මහළු, යහළු, එළු, කුරුලු, වළලු
   iii. බිළිඳු, දිළිඳු, අළුත්, ඔලිඳ
   iv. කලුරිය, ඉහළ, ගැටලු, පොළ
   v. මකුළු, ළැහැබ, කෙළිබිම, පිළිම

4. **අන්‍යාර්ථ, අව්‍යය, විභක්ති, විශේෂණ සමාසවලට අයත් පද පිළිවෙළින්** යෙදී ඇති වරණය තෝරන්න.
   i. සියපත, සුදන, දසසිල්, පොල්තෙල්
   ii. දිනකර, සුවිශාල, බුදුගුණ, ඇත්දළ
   iii. සහසැස්, ඉමිහිරි, විදුලිබිල, මුතුදසන්
   iv. පරපුටු, දසපාරමිතා, අවගුණ, පන්සිල්
   v. දුදන, තිනෙත්, කිරිබත්, තුන්දොර

5. **උක්ත පද පමණක් සහිත** වරණය තෝරන්න.
   i. මම, අප, තෝ, තා
   ii. තොපි, තෙප, ඔවුහු, ඈ
   iii. මිනිසුන්, මිනිසෙක්, තොපි, අපි
   iv. කෙනෙකු, ඇතමෙක්, අයෙකු
   v. ගවයෝ, අපි, මම, තෝ

6. **අකාරාදි පිළිවෙළට නිවැරදි** වරණය තෝරන්න.
   i. කාන්චනා, කුමාරි, කෝසලා, කුමුදිනි, කෞමලි
   ii. ගංගා, ගයානි, ගයාත්‍රි, ගීතිකා, ගීතානි
   iii. අංජුලා, මංජුනී, සංජුලා, හංසිකා, හේෂාණි
   iv. ප්‍රියංකා, ප්‍රීතිකා, පබෝධි, පියංවදා, පමුදිනි
   v. දිව්‍යා, දේවිකා, දයානි, දුෂ්‍යන්ති, දුමේකා

7. මුලින් දැක්වෙන පදයට **විරුද්ධාර්ථය සහිත පද ඇතුළත්** වරණය තෝරන්න.
   i. සංයෝජන- සංශෝධන, අසංයෝග, විප්‍රයෝග
   ii. විරල - සුලබ, බහුල, නිතර, නිරතුරු ව
   iii. ලෝකෝත්තර - රහත්, ඉන්ද්‍රිය ගෝචර, අතීන්ද්‍රිය
   iv. සාවද්‍ය - වැරදි, වංක, වත්, ඇද
   v. ආයාස - උත්සාහය, ප්‍රයත්නය, වීර්ය, ධෛර්යය

8. ඒ විල **තෙමේ** වෙසමුණු **රජ්ජුරුවන්ගෙන්** එක් **දියරකුසෙකු** විසින් ලබන ලද්දේ ය.
   ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පද අයත් වන **විභක්ති නිවැරදි ව නම් කොට ඇති** වරණය තෝරන්න.
   i. ප්‍රථමා, කර්ම, කරණ
   ii. කරණ, කර්ම, සම්බන්ධ
   iii. ප්‍රථමා, අවධි, කර්තෘ
   iv. ප්‍රථමා, කරණ, කර්තෘ
   v. කර්ම, අවධි, කර්තෘ

9. දරුවා අවදි ව, මුහුණ සෝදා, කා, බී, ඇඳ, පැළඳ පොතපත ගෙන පාසලට ගියේ ය.
   මෙහි ඇති **පූර්ව ක්‍රියා** ගණන වන්නේ,
   i. 06කි.
   ii. 07කි.
   iii. 08කි.
   iv. 09කි.
   v. 05කි.

10. **උපසර්ගයක් යෙදී නැති** වරණය තෝරන්න.
   i. ප්‍රතිඵල, ප්‍රාතිහාර්ය, ප්‍රකෘති, ප්‍රතිචාර, ප්‍රතිකාර
   ii. උපදේශ, උපචාර, උපවනය, උපනායක
   iii. විපත්, විදෙස්, විරති, විරාග
   iv. නිශ්ශබ්ද, නිස්සාර, දුස්සාධ්‍ය, දුස්සීල
   v. සංවර්ධන, සම්පූර්ණ, සම්මිශ්‍රණ, සංරක්ෂණ

11. **නිවැරදි ප්‍රකාශය සහිත** වරණය තෝරන්න.
   i. සිංහල භාෂාවේ ව්‍යඤ්ජන අක්ෂර 18කි.
   ii. ඞ, ඤ, ණ, න, ම යනු අර්ධ ස්වර වේ.
   iii. ශ්‍රැති සූචනාර්ථයෙහි නිපාත සිංහල භාෂාවේ නැත.

iv. වාක්‍යයක මුල, මැද, අග විවිධාර්ථ පවසන පද උපසර්ග ලෙස හැඳින්වේ.
v. තද්ධිත හා කෘදන්ත යනු ප්‍රත්‍යාර්ථ නාම වේ.

12. **සිංහලයෙහි භාෂණ සන්ධි සඳහා නිදසුනක් ලෙස සඳහන් කළ නො හැකි පදයක් සහිත** වරණය තෝරන්න.
   i. අඬන්නෙපා
   ii. පණවද්දෙන්නං
   iii. පොලියත්තෙක්ක
   iv. පොත්තල්මාරිය
   v. ජීවනාධාර

13. **ශුද්ධ ආඛ්‍යාත ක්‍රියාවක් නො මැති** වරණය තෝරන්න.
   i. බලමි
   ii. බලයි
   iii. නරඹති
   iv. පදවයි
   v. බැලේ

14. **තත්සම ප්‍රකෘතියක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
   i. සුර
   ii. රජ
   iii. විල්
   iv. ගිරි
   v. දින

15. **කෘදන්ත පදයක් ඇතුළත් ව නො මැති** වරණය තෝරන්න.
   i. නැටුම්, බැලීම්, නැටිලි, ගැයිලි
   ii. බැලුම්, කියමන්, ලියමන්, හැඬිලි
   iii. දුවන, රැගුම්, දුවන්නා, සොයති
   iv. කෙඳිරිලි, සිතුම්, ගැයීම්, පිසුම්
   v. ලියන්නී, වයන්නී, ගයන්නෝ, විචාරන්නෝ

16. **තද්ධිත පදයක් ඇතුළත් නො මැති** වරණය තෝරන්න.
   i. නාගරික, ඓතිහාසික, නෛතික, දෛනික
   ii. ගුණවත්, බවලත්, වරලත්, ධනවත්
   iii. වෘද්ධතර, ගරුතර, සෙල්මුවා, රජතමය
   iv. පියාණෝ, සිටාණෝ, දියණියෝ, මැණියෝ
   v. තාරුණ්‍යය, සෞන්දර්ය, ඖදාර්ය, වීර්යය

17. **කාලය හඟවන නිපාත හෙවත් කාලාර්ථ නිපාත පමණක් යෙදී** ඇති වරණය තෝරන්න.
   i. යළි, වැළි, පිළි, පැසුළු, ඉක්බිති
   ii. අද, හෙට, හැර, විය, මුත්
   iii. නිති, නිතර, අනතුරු, තකා, සඳහා
   iv. නිබඳ, නිතර, මන්ද, කින්ද, ද
   v. තව, දැන්, හෙට, ඊයේ, ත්, ද

18. '**අහස' යන්නට සමානාර්ථයක් නැති** වරණය තෝරන්න.
   i. නබෝගැබ    ii. සහතුරුවැල
   iii. ගගන    iv. සියොත්මගි
   v. තාරපති